SLMA SRI LANKA MEDICAL ASSOCIATION
6, Wijerama Mawatha, Colombo 7, Sri Lanka T'Phone: 2693324 Fax: 2688802
E-mail: office@slma.lk Website: www.slma.lk

# මාධ්‍ය ප්‍රකාශය

## ශ්‍රී ලංකාව තුළ ගංජා වගාව නීතිගත කිරීමට උත්සාහ කිරීම

ගංජා වගාව නීතිගත කිරීම සම්බන්ධයෙන් ප්‍රවෘත්ති සහ සමාජ මාධ්‍ය පළ කිරීම් කිහිපයක්ම පසුගිය දිනවල ඉදිරිපත් කර තිබුණි. එය සාධාරණීකරණය කිරීමට හේතුව ලෙස සඳහන් වී තිබුණේ සමහරක් ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය සඳහා මෙම ශාකයෙහි අවශ්‍යතාවයයි .

මෑතකදී, පූජ්‍ය පක්ෂයේ ප්‍රමුඛ සාමාජිකයෙකු විසින් මෙන්ම දේශීය වෛද්‍ය ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධනය සහ ප්‍රජා සෞඛ්‍යය අමාත්‍යතුමන් විසින් ද මෙම ප්‍රතිපත්තිය සඳහා සහයෝගය දක්වන ප්‍රකාශයන් නිකුත්විය. තවද, පසුගිය වසරේදී ද එවකට සිටි සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමන් ද මේ පිළිබඳව එවැනිම ප්‍රකාශයක් නිකුත්කරන ලදී.

ගංජා වගාව ප්‍රවර්ධනය කරන මෙම ප්‍රසිද්ධ ප්‍රකාශයන් පිළිබඳව අපි ඉතා සැලකිලිමත් වෙමු. මෙම විෂය පිළිබඳ කැබිනට් පත්‍රිකාවක් පවා පසුගිය වසරේදී ඉදිරිපත් කළ බව 2019 පෙබරවාරි 2 දින ඩේලි නිවුස් පුවත්පත වාර්තා කර තිබුණි.

මීට සමගාමීව, බොහෝ සමාජ මාධ්‍ය සටහන් සහ වීඩියෝ මගින් ද ගංජා භාවිතය ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික සෞඛ්‍ය සම්පන්න පුරුද්දක් ලෙස ප්‍රවර්ධනය කරමින් පවතී. මේ අතර, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව සමඟ එක්ව ගංජා ආශ්‍රිත තෙල් නිෂ්පාදනය කිරීමට පෞද්ගලික සමාගමක් විසින් කරන ලද යෝජනාවක් සහ ඒ වෙනුවෙන් ගංජා වගා කිරීම සඳහා නිල අවසරයක් ලබාගැනිමට කරනු ලබන උත්සාහයක් සම්බන්ධයෙන් ද අපට දැනගන්නට ලැබී ඇත.

මෙම යෝජනාව ඉදිරිපත් වී ඇත්තේ, සාමාන්‍ය පුද්ගලයන්ගේ භාවිතය සඳහා ගංජා වගාව නීතිගත කිරීම සඳහා ජාත්‍යන්තර වශයෙන් ද දැවැන්ත පීඩනයක් පවතින මොහොතකය.

විෂ, අබිං හා අන්තරායක ඖෂධ ආඥා පනත මගින් ශ්‍රී ලංකාවේ ගංජා වගා කිරීම හා භාවිතය තහනම් කර ඇත. මෙය අන්තරයක ඖෂධයක් ලෙස ඒ පිළිබඳව ජාත්‍යන්තර සම්මුතීන් මගින් ද වර්ගීකරණය කර ඇත. (The Single Convention on Narcotic Drugs of 1961 සහ the United Nations Convention Against Illicit Traffic in Narcotic Drugs and Psychotropic Substances of 1988).

ඇතැම් ආයුර්වේද ඖෂධ සඳහා පවතින අවශ්‍යතාවය සලකමින් , ශ්‍රී ලංකාව තුල වෛද්‍ය භාවිතය සඳහා පමණක් ගංජා යොදාගැනීමට නීතියෙන් අවසර ලබා දී ඇත. ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා අවශ්‍ය ඖෂධ වෙනුවෙන් ගංජා සැපයීමට දීර්ග කාලයක් පුරා පැවතෙන වැඩපිළිවෙලක් ආයුර්වේද දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක වේ. එබැවින් ශ්‍රී ලංකාව තුළ ගංජා වගාව නීතිගත කිරීමේ අවශ්‍යතාවයක් නොමැත.

මෙහිදී, ආයුර්වේද වෛද්‍යවරුන්ට අවශ්‍ය සැපයුමේ හිඟයක් ඇත්නම් එම හිඟ අවශ්‍යතාවය ඉතා දැඩි කොන්දේසි යටතේ ආනයනය කිරීම වැනි විකල්පයන් පිළිබඳව රජයට සොයා බැලිය හැකිය. ඒ වෙනුවට ගංජා වගාවට ඉඩ දුනහොත් එය සාමාන්‍ය ජනතාව අතරට යාම වැළැක්විය නොහැකිවනු ඇත .

193 කට වැඩි සංඛ්‍යාවක් වන එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල් අතරින් රටවල් දෙකක් පමණක් සහ වෙනත් රටවල් කිහිපයක ප්‍රාන්ත හෝ දිස්ත්‍රික් කිහිපයක් පමණක් මත්ද්‍රව්‍යක් ලෙස ගංජා භාවිතය නීතිගත කර ඇත. එවැනි නීතිගත කිරීමකින් සිදුවන්නේ මහාපරිමාණ ගංජා නිෂ්පාදන ස්ථාපිත වීම සහ මෙම සමාගම් බහුජාතික සමාගම් ලෙස ප්‍රවර්ධනය වීමයි . බලවත් බහුජාතික දුම්කොළ හා මධ්‍යසාර සමාගම් දැනටමත් ඩොලර් බිලියන ගණනක් ආයෝජනය කරමින් එවැනි සමාගම්වල හවුල්කරුවන් බවට පත්ව ඇත. උතුරු ඇමරිකාවේ යෞවනයන්

දැනටමත් විද්‍යුත් දුම් පානය කිරීමේ උපකරණ යොදාගනිමින් ගංජා භාවිතා කරයි. මත්පැන් කර්මාන්තය සහ බීම කර්මාන්තය දැනටමත් ගංජා පදනම් කරගත් නිෂ්පාදන අත්හදා බලමින් සිටී.

මෙම වාණිජ නිෂ්පාදන ජානමය වශයෙන් නවීකරණය කරන ලද ගංජා පැල හෝ ඒ හා සමාන කෘතිම රසායනික ද්‍රව්‍ය භාවිතා කරන අතර එමගින් ඉතා අධික සාන්ද්‍රනයන්ගෙන් ගංජා පරිභෝජනය කිරීමට දිරිගන්වයි. බහුජාතික සමාගම් විසින් මෙලෙස වාණිජ වශයෙන් ගංජා වගාව සිදු කරනවිට, ශ්‍රී ලංකාවේ දේශීය නිෂ්පාදනයක් ලෙස ගංජා ප්‍රවර්ධනය කරන්නන් සිතන පරිදි, එහි සම්ප්‍රදායික ප්‍රභේද සඳහා ඉඩක් නොලැබෙනු ඇත.

මේවනවිට ශ්‍රී ලංකාවේ සහ ලෝකයේ වැඩිපුරම භාවිතා වන මනෝ ක්‍රියාකාරී නිෂ්පාදනය වන්නේ ගංජා ශාකයයි. ලොව පුරා තරුණ තරුණියන් විසින් බහුලව භාවිතා වන නීති විරෝධී ඖෂධය ද මෙයයි. මෙහි ඖෂධිය වැදගත්කම ගැන බොහෝ ප්‍රකාශ නිකුත්වුවද , ගංජා ආශ්‍රිත ඖෂධ මගින් සුව වන්නේ යයි පැවසෙන රෝග ප්‍රමාණය ඉතා ස්වල්පයක් පමණකි. එමෙන්ම එම රෝග සඳහා ගංජා භාවිතා නොකර භාවිතා කල හැකි ඖෂධ බොහොමයක්ද ලෝකයේ ඇත. යම් රසායනිකයක් රෝගයකට ප්‍රතිකාර කිරීමේදී යහපත් බලපෑමක් ඇති කල ද එම රසායනය මත්ද්‍රව්‍යක් ලෙස භාවිතා කිරීම සඳහා ඉඩලබාදීම සුදුසු නොවේ. උදාහරණයක් ලෙස, පොපි ශාකයේ සාරය සහ එහි රසායනික ව්‍යුත්පන්නයන් ලොව පුරා වේදනා නාශක ඖෂධ ලෙස බහුලව භාවිතා වේ. නමුත් මෙම ශාකයෙන්ම ලබාගන්නා හෙරොයින් මත්ද්‍රව්‍යක් ලෙස භාවිතය සඳහා ප්‍රවර්ධනය කළ යුතු බව කිසිවෙක් පවසන්නේ නැත..
තවද , ගංජා භාවිතයෙන් සිදුවන සෞඛ්‍යමය හානි බොහොමයකි .මානසික අවපීඩනය, භින්නෝන්මාදය වැනි මානසික රෝග මෙන්ම බරපතල ශ්වසන අබාධ ද මෙනිසා ඇතිවේ. එය නව යොවුන් වියේ දරුවන්ගේ මොළයේ වර්ධනයට ද හානිකර ලෙස බලපායි. එමෙන්ම ගංජා භාවිතයෙන් සිදුවන මානසික විකෘති තත්ත්වය නිසා සිය දිවි හානි කරගැනීම් සහ ස්වයං හානිකර ගැනීම් බහුලව සිදුවේ. දැනටමත් සියදිවි හානි කරගැනීම අතින් ප්‍රමුඛ ස්ථානයක ඇති ශ්‍රී ලංකාව තවදුරටත් අගාධයකට වැටීම වලක්වා ගතයුතුය.

ගංජා ආශ්‍රිත රසායනික ද්‍රව්‍ය ඉහළ සාන්ද්‍රණ වලින් ජනතාව විසින් පරිභෝජනය කරන විට මෙම රෝගී තත්ත්වයන් මෙන්ම අනෙකුත් රෝගාබාධ ද වැඩි වශයෙන් දැකගන්නට ලැබෙනු ඇත. එබැවින්, ශ්‍රී ලංකාවේ ගංජා පරිභෝජනය අඩු කිරීම සඳහා සියලු පියවර ගන්නා ලෙසත්, දැනට ක්‍රියාත්මක කර ඇති ක්‍රියාමාර්ග ලිහිල් කිරීමට ඉඩ නොදෙන ලෙසත් අපි ශ්‍රී ලංකා රජයෙන් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිමු.

එමෙන්ම, ගංජා භාවිතය ප්‍රවර්ධනය කිරීම සඳහා ක්‍රියාකරන සමාජ මාධ්‍ය සහ ගංජා ප්‍රවර්ධනය කරන්නන් සඳහා නීතිය දැඩිලෙස ක්‍රියාත්මක කරන ලෙස ද අපි ඉල්ලා සිටිමු. ඔවුන්ගේ මතයට පටහැනිව මහජන සෞඛ්‍යය හා මහජන ආරක්ෂාව ප්‍රවර්ධනය කරන අයට ද මෙම කණ්ඩායම දරුණු ලෙස පහර දෙන බව ද පෙනීයයි.
ශ්‍රී ලංකාව දැනටමත් සිගරට් සහ මත්පැන් වැනි නීති විරෝධී නොවන මත්කාරක මෙන්ම හෙරොයින් වැනි නීති විරෝධී මත්ද්‍රව්‍ය නිසා ද අධික ලෙස පීඩා ලබමින් සිටී. මෙම තත්ත්වය තවදුරටත් තීව්‍ර කරගැනීම කිසිසේත් සිදුනොවිය යුතුය.

කිසියම් ආකාරයක ගංජා නීතිගත කිරීමක් රට තුළ සිදුවුවහොත් එය මාරාන්තික කර්මාන්තයකට ලබාදෙන විශාල ජයග්‍රහණයක් වනු ඇති අතර සියලු ශ්‍රී ලාංකිකයින්ට අත්වන දැවැන්ත සමාජයිය හා ආර්ථික පරාජයක් වනු ඇත.


I. M. Karunathilake

මහාචාර්ය ඉන්දික කරුණාතිලක
සභාපති
ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය

Prof. Indika Karunathilake
MBBS (COL) DMedEd (UK), MMedEd (UK), FHEA (UK), FCME (SL), FCGP(Hon.) (SL), FRCP (Edin.)
Professor in Medical Education, University of Colombo
President
Sri Lanka Medical Association

මහාචාර්ය නාරද වර්ණසූරිය
සභාපති
දුම්කොළ, මධ්‍යසාර හා නීති විරෝධී ඖෂධ පිළිබඳ විශේෂ කමිටුව, ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය